# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1856/20 – 2014 අප්‍රේල් 02 වැනි බදාදා – 2014.04.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**පවිත්‍රතා සේවා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වන අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ 30 වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිදි ඇතුළත් කිරීමට පවිත්‍රතා සේවා කර්මාන්තය පිළිබඳ පඩි පාලක සභාව යෝජනා කරන බැව් එකී පඩිපාලක සභා ආඥාපනතේ 28 වන වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවලට දැක්වෙන විරෝධතා වර්ෂ 2014 අප්‍රේල් මස 29 වැනි දින මධ්‍යාහ්න 12.00 දක්වා මෙම පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

එබඳු වූ සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර එම විරෝධතාවය දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ඊට අඩංගු විය යුතුය.

වී. බී. පී. කේ. වීරසිංහ,
සභාපති
පවිත්‍රතා සේවා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2014 මාර්තු මස 20 වැනි දින,
කොළඹ 05.
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

උපලේඛනය

පවිත්‍රතා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරනු ලදුව 1993/07/07 දින අංක 774/5 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ නිවේදනයේ සඳහන් උපලේඛනයේ සවිස්තරාත්මකව දක්වා ඇත්තා වූ ද, කලින් කල වෙනස් කරන ලද්දා වූ ද, 2010 මැයි 31 දින අංක 1656/10 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනයේ හඳුන්වා දෙන ලද සේවා කොන්දේසිවල, II කොටස තවදුරටත් පහත කොටස ආදේශ කරමින් වෙනස් කරනු ලැබේ.

(ආ) කොටස

**අතිකාල ගෙවීම් ප්‍රමාණය**

වැඩ කරන සාමාන්‍ය දවසකට වඩා වැඩිපුර වැඩ කරන සෑම පැයක් සඳහාම ගෙවිය යුතු අතිකාල ගෙවීම් ප්‍රමාණය වන්නේ දෛනික වැටුප 8න් බෙදීමෙන් නිශ්චය කරගත් ප්‍රමාණය මෙන් එකහමාරක ගුණයකි.

04 - 415

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.